**බැල්ලන්තුඩාව අච්චිගේ නුවන් චාමර ඉදුනිල්**

නීතීඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්

415/34, පිටත හයිලෙවල් පාර,

ගංගොඩවිල

පෙර ලියාපදිංචිය-

දෙවන පිටපත්- හෝමගම

ඉඩම පිහිටි පළාත් පාලන ආයතනය-

ඉ.ලි.කිරීමේ කාර්යාලය-

---

**අංකය:**

# 290

**රු10,000.00**

## වකුගඩු , දියවැඩියා සහ දෘෂ්‍යාබාධිත රෝගීන් සඳහා වූ සිංහ සමාජ රෝහල් භාර ගිවිසුම

**සියලුම දෙනා මෙයින් දැන ගත යුතුය**

ජාත්‍යන්තර සිංහ සමාජ 306 ඒ 02 සිංහ දිස්ත්‍රිකයේ කැබිනට් මණ්ඩලය විසින් 2022 මැයි මස 02 දින පවත්වන ලද කැබිනට් රැස්වීමේදි යෝජනා සම්මත කරගත් පරිදි පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනිම සඳහා වකුගඩු , දියවැඩියා සහ දෘෂ්‍යාබාධිත රෝගීන් සඳහා වූ සිංහ සමාජ රෝහලක් ඉදිකර පවත්වාගෙන යෑම සඳහා භාරයක් පිහිට වීමට අවශ්‍යව ඇති හෙයින් මෙහි මින්මතුවට **"ප්‍රදායක"**යැයි කියනු ලබන 306 ඒ 2 සිංහ දිස්ත්‍රික්කයේ 2022-2023 සිංහ වසරේ සිංහාධිපති,ගල්කිස්ස විලියම්ස් පෙදෙස අංක 06 යන ස්ථානයේ පදිංචි **හැන්නදිගේ කුමුදු තුෂාර පීරිස්** (ජා.හැ අංක 593240525වී) ) යන අය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන වගනම්,

1. භාරය පිහිටවීම සඳහා ප්‍රදායකයා විසින් රු10,000/- ක මුදලක් පරිත්‍යාග කර සිටියි.
2. **භාරයේ නම:**
   පහත අරමුණු සාක්ෂාත් කිරිම සඳහා භාර මණ්ඩලයක් තිබිය යුතු අතර එය "වකුගඩු , දියවැඩියා සහ දෘෂ්‍යාබාධිත රෝගීන් සඳහා වූ සිංහ සමාජ රෝහල් භාරය" නමින් හැඳින්විය යුත්තේය.
3. **භාරයේ අරමුණු සහ අභිමතාර්ථයන්**
   I. වකුගඩු , දියවැඩියා සහ දෘෂ්‍යාබාධිත රෝගීන් සඳහා වූ සිංහ සමාජ රෝහල සමාජ සත්කාරක පුණ්‍ය භාරයක් ලෙස පවත්වාගෙන යෑම.
   II. වකුගඩු , දියවැඩියා සහ දෘෂ්‍යාබාධිත රෝගීන් සඳහා වූ සිංහ සමාජ රෝහලක් ඉදිකර පවත්වාගෙන යෑම.
   III. විශේෂයෙන්ම අඩු අදායම්ලාභීන් හා අවමපහසුකම් ලත් පවුල් වල වකුගඩු , දෘෂ්‍යාබාධිත සහ දියවැඩියා රෝගීන් හඳුනාගැනිම, දැනුවත් කිරිම සහ ප්‍රතිකාර කිරිම.
   IV. අනෙකුත් බෝ නොවන රෝග පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
   V. වකුගඩු , දෘෂ්‍යාබාධිත සහ දියවැඩියා රෝග සම්බන්ධව කටයුතු කරන දේශිය සහ විදේශිය ආයතන සමග කටයුතු කිරිම.
   VI. සෞඛ්‍ය සම්පන්න ජිවිතයක් සඳහා ප්‍රජාවට පහසුකම් සැපයිම.



Scanned with CamScanner

4. **භාරයේ කාර්යභාර්**

I. භාරයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්ති, උපායමාර්ග තීරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

II. භාරය වෙනුවෙන් මූල්‍ය ඇස්තමේන්තු සකස් කිරීම,අරමුදල් සම්පාදනය කිරීම, මූල්‍ය ඇස්තමේන්තු සකස් කිරීම, වියදම් අනුමත කිරීම.

III. භාරයේ පොදු අරමුණ සඳහා මුදල් එකතු කිරීම, පරිත්‍යාග භාර ගැනීම සහ බදු සහන යනාදිය ඉල්ලුම් කිරීම සහ සෙසු සහන ප්‍රවර්ධනය කිරීම හා පවත්වාගෙන යෑම.

IV. රෝහල ඉදිකිරීම හා භාරය පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය මුදල් රැස්කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

V. ශ්‍රී ලංකා මහා බැංකුව අනුමත කරනු ලබන ඕනෑම වාණිජ බැංකුවක් සමග ගිණුම් ආරම්භ කොට පවත්වාගෙන යෑම, ණය ගිවිසුම් වලට එළැඹීම.

VI. සේවකයන් බඳවා ගැනීම, ඉවත් කිරීම විනය පරීක්ෂණ පැවැත්වීම.

VII. භාරයේ අරමුණුවලට අනුකූල කටයුතු සඳහා ඉඩම් ඇතුලු නිශ්චල දේපල මිලදී ගැනීම, විකිණීම, බදු දීම සහ උකස් කිරීම, ත්‍යාග දීම, ත්‍යාග භාර ගැනීම.

VIII. භාරය පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය වෙනත් ඕනෑම නීත්‍යානුකූල කටයුත්තක යෙදීම.

5. **අර්ථලාභීන්**

ශ්‍රී ලංකාව තුල ජීවත්වන් අඩු ආදායම්ලාභී වකුගඩු,ඇස් සහ දියවැඩියාව ආශ්‍රිත රෝග වලින් පීඩා විඳින ජනතාව.

6. **භාරයේ ස්ථිර ලිපිනය**

අංක 10, සිරිවර්ධන පාර, දෙහිවල

7. **භාර මණ්ඩලය සහ සාමාජිකත්වය**

I. භාර මණ්ඩලයේ සාමාජිකත්වය උපරිම විසි පස් දෙනකුට සීමා විය යුතු අතර එය පහත සඳහන් පරිදි විය යුතුය.

අ. ගරු සාමාජිකයන්

ආ. යාවජීව සාමාජිකයන්

ඇ. නිල බලයෙන් පත්වන සාමාජිකයන්

ඈ. තොරා පත්කරගනු ලබන සාමාජිකයන්

II. **ගරු සාමාජිකයන්**

අ. භාරයේ අරමුණු සාකෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා යහපත් පැවත්මකින් යුතු සිංහ සේවයට සම්බන්ධ පුද්ගලයකු භාරය සඳහා ගරු සාමාජිකයකු ලෙස පත් කළ හැක්කේය.

ආ. භාරකාර මණ්ඩලයේ අදහස් විමසීමෙන් පසුව 306 ඒ 2 සිංහ දිස්ත්‍රික්කයේ කැබිනට් මණ්ඩලය විසින් පත් කරනු ලබන තිදෙනකුට නොවැඩි සංඛ්‍යාවක් ගරු සාමාජිකයන් ලෙස පත්කල හැක්කේය.

ඇ.ඡන්දය දීමේ අයිතිය හැර, අදහස් දැක්වීම, රැස්වීම් වලට සහභාවීම සඳහා අයිතිය ගරු සාමාජිකයන් සතුවන්නේය.

ඈ. මියයාම, සභාපති හෝලේකම් වෙත ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත ඉල්ලා අස්වීම, භාරයේ කටයුතු සඳහා සක්‍රියව දායකවීමට නොහැකිවීම ,ශාරීරික හෝ මානසික දුබලතාව මත සිය වගකීම් ඉටු කිරීමට නොහැකි බව හෝ සිංහ සේවය ගෞරවයට හානිවන ආකාරයේ හැසිරීම හේතුවෙන් භාරකාර මණ්ඩලයේ නිර්දේශය මත කැබිනට් මණ්ඩලයේ බහුතර යෝජනාවකින් ඉවත් කලහොත් මිස ගරු සාමාජිකයකු වසර 3 කාලයක් ධුරය දරන්නේය.

ඉ. ඉහත යම් ආකාරයකින් ඇතිවන පුරප්පාඩුවක් භාරකාර මණ්ඩලයේ නිර්දේශය මත ඉනික්බිතිව පැවත්වෙන කැබිනට් මණ්ඩලය විසින් පිරවිය යුත්තේය.



Scanned with CamScanner

උ. ඉහත පරිදි කැබිනට් මණ්ඩලය විසින් ඉවත් නොකල ගරු සාමාජිකයකුට නැවත පත්වීමේ හිමිකම ඇත්තේය.

## III. යාව ජීව සාමාජිකයන්

අ. 1) කන්දේ ගමරාලලාගේ විජේසිරි (562910565වී)

2) මලිගස්පේ කෝරාලගේ අනිල් අර්වින් නානායක්කාර (196004110078)

ආ. යාව ජීව සාමාජිකයකු මියයාම, සභාපති හෝ ලේකම් වෙත ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත ඉල්ලා අස්වීම, භාරයේ කටයුතු සඳහා සක්‍රියව දායකවීමට නොහැකිවීම ,ශාරීරික හෝ මානසික දුබලතාව මත සිය වගකීම් ඉටු කිරීමට නොහැකි බව හෝ සිංහ සේවය ගෞරවයට හානිවන ආකාරයේ හැසිරීම මත භාරකාර මණ්ඩලයේ 2/3 නිර්දේශය මත කැබිනට් මණ්ඩලයේ බහුතර යෝජනාවකින් ඉවත් කලහොත් මිස ස්වකීය ජීවිතකාලය සඳහාම සාමාජිකත්වය දරන්නේය.

## IV. නිල බලයෙන් පත්වන සාමාජිකයන්

306ඒ2 සිංහ දිස්ත්‍රික්කයේ සිංහාධිපති, ආසන්න පෙර සිංහාධිපති, පළමු සහ දෙවන උපසිංහාධිපතිවරු , කැබිනට් ලේකම්, කැබිනට් භාණ්ඩාගාරික සහ කාන්තා කමිටුවේ සභාපති නිලබලයෙන් භාරයේ සාමාජිකත්වයට පත්වන්නේය.

## V. තෝරාපත්කර ගනු ලබන සාමාජිකයන්

අ. භාරය සඳහා භාරයේ අදහස් විමසීමෙන් පසුව මනා පැවත්මකින් යුතු සිංහ සමාජයක සාමාජිකයකු වන අවම වශයෙන් පෙර අධිපතිවරු 03 දෙනකු සහ කැබිනට් සාමාජිකයන් පස් දෙනෙකුටනොඅඩු 12 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් කැබිනට් මණ්ඩලය විසින් භාරකරුවන් වශයෙන් පත් කල යුත්තේය.

ආ. මියයාම, සභාපති හෝලේකම් වෙත ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත ඉල්ලා අස්වීම, දන්වනු ලබන සාධාරණ හේතුවක් මත භාරයේ රැස්වීම් සඳහා අඛණ්ඩව වාර තුනකට වඩා සහභාගි නොවීම, භාරයේ කටයුතු සඳහා සක්‍රියව දායකවීමට නොහැකිවීම ,ශාරීරික හෝ මානසික දුබලතාව මත සිය වගකීම් ඉටු කිරීමට නොහැකි බව හෝ සිංහ සේවය ගෞරවයට හානිවන ආකාරයේ හැසිරීමක් මත භාරකාර මණ්ඩලයේ නිර්දේශය මත කැබිනට් මණ්ඩලයේ බහුතර යෝජනාවකින් ඉවත් කලහොත් මිස තෝරාපත් කරගනු ලැබූ භාරකරුවකු වසර තුනක කාලයක් සඳහා ධූරය දරන්නේය.

ඇ. කැබිනට් මණ්ඩලය විසින් ඉවත් නොකරන ලද ඉහත වෙනත් ආකාරකින් පත්වූ සිංහ සාමාජිකයකු එසේ පත්වීම නැවත වෙනත් ඛාණ්ඩයක් යටතේ තේරි පත්වීම සඳහා බාධාවක් නොවිය යුත්තේය.

## VI. පුරප්පාඩුවක් පැවතීම භාරයේ කටයුතු සඳහා බලනොපාන බව

භාරය සඳහා සියලු වර්ගයන්ගෙන් පත් කල පසු, පසු කාලීනව ඉහත සඳහන් යම් සාමාජිකයකු භාරය තුල නියෝජනය නොවීම මත භාරයේ කටයුතු නතර නොවන අතර භාරය විසින් ගනු ලබන තීරණ හෝ ක්‍රියාමාර්ග බල්රහිත නොවන්නේය.



Scanned with CamScanner

**8. රැස්වීම්**

I. භාරය අවම වශයෙන් මාස තුනකට වරක් වත් රැස්විය යුතුය.

II. රැස්වීමක් පැවත්වෙන දිනය, ස්ථානය සහ වෙලාව සියලුම සාමාජිකයන්ට දින 10 කට පෙර දැන්වීම ලේකම්වරයාගේ වගකීම වන්නේය.

III. රැස්වීමක් සඳහා ඝණ පූර්ණය, යාවජීව සාමාජිකයකු, නිලබලයෙන් පත්වන සාමාජිකයන් අතුරින් තිදෙනකු සහා තොරා පත් කරන්නා ලද සමාජිකයන් අතරින් තිදෙනකු සහිතව සාමාජිකයන් 7 දෙනකු විය යුතුය.

**9. විශේෂ රැස්වීම්**

I. භාරයේ සභාපතිවරයා විසින් හෝ සිංහාධිපතිවරයා විසින් හෝ යාව ජීව සාමාජික සාමාජිකයන් දෙදෙනකු හෝ සාමාජිකයන් හය දෙනෙකු විසින් තමා වෙත යොමුකරනු කරනු ලබන නිශ්චිත කරුණක් හෝ කාරණා සඳහා විශේෂ රැස්වීමක් කැඳවිම ලේකම්වරයාගේ වගකීම විය යුත්තේය.

II. විශේෂ රැස්වීමක් සඳහා අවම වශයෙන් දින 03 ක පූර්ව දැනුවත් කිරීමක් විය යුතු අතර එම විශේෂ රැස්වීමේ න්‍යාය පත්‍රය, ඝණ පූර්ණය සහිතව සිටියදි බහුතර යෝජනාවකින් වෙනත් අයිතමයක් ඇතුලත් නොකළහොත් එම විශේෂ රැස්වීම කැඳවීම සඳහා කරනු ලැබූ ඉල්ලීමේ සඳහන් කරුණුවලට සීමා විය යුතුය.

**10. භාර මණ්ඩලයේ වගකීම්, කාර්ය සහ බලතල**

I. භාරය පවත්වාගෙන යෑම සඳහා දිස්ත්‍රික් ව්‍යවස්ථාවට සහ මෙම ව්‍යවස්ථාවට අනනුකූල නොවන අතුරු නීති සහ රීති සම්පාදනය කිරීම.

II. භාරය වෙනුවෙන් වෙනත් සංවිධාන සමග ගිවිසුම් එකඟතා සහ ආයෝජන සඳහා එළැඹිම.

III. භාරය වෙනුවෙන් නිශ්චල සහ චංචල දේපල මිලදී ගැනිම, බැහැර කිරීම , බදුදීම හෝ කුලියට දීම.

IV. භාරය වෙනුවෙන් සේවකයන් බඳවා ගැනීම, උසස් කිරීම විනය පාලනය සහ ඉවත් කිරීම.

**11. භාරයේ නිලතල**

I. සභාපති

අ. රැස්වීම් කැඳවීම, මෙහෙයවීම සහ මුලසුන දැරීම සභාපතිවරයාගෙ වගකීම වන්නේය.

ආ. යම් කරුණක් සම්බන්ධයෙන් භාරයේ සාමාජිකයන්ගේ චන්දය පක්ෂව හා විපක්ෂව භාවිතවන චන්ද සංඛ්‍යාව සමාන වන විට සභාපතිවරයාට අතිරේඛ තීරක චන්දයක් හිමිවන්නේය.

ඇ. භාරයේ නිල මුද්‍රාව සභාපතිවරයාගේ භාරයේ තිබිය යුතු අතර භාරයේ ලේඛණ සඳහා නිල මුද්‍රාව තැබීම .

ඇ. මෙම ව්‍යවස්ථාව මගින් පැවරෙන කරුණුවලට අමතරව චාරිතානුලව සභාපතිවරයකුට පැවරෙන වගකීම් සහ කර්තව්‍යන් ඉටුකිරීම.

ඉ. සිංහාධිපතිවරයා විසින් උප සිංහාධිපතිවරයන් විමසා භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා පත් කල යුත්තේය.

II. ලේකම්

අ. භාරයේ රැස්වීම් සහ විශේෂ රැස්වීම් වාර්තා පවත්වාගෙන යෑම.

ආ. භාරය සතු ලේඛන නිසි ආකාරයෙන් පවත්වාගෙන යෑම.



Scanned with CamScanner

ඇ. භාරය වෙනුවෙන් වෙනත් සංවිධාන සමහ සන්නිවේදන කටයුතු කිරීම.

III. භාණ්ඩාගාරික

අ. රජයේ නියාමනය සඳහා අවශ්‍ය වන මූල්‍ය වාර්තා ද ඇතුලුව සංගමයේ ආදායම් වියදම් වාර්තා පවත්වාගෙන යෑම.

ආ. ලදුපත් සහ ගෙවීම් පත් නිකුත් කිරීම.

ඇ. භාරයේ නිශ්චල සහ චංචල දේපල සහ එවායේ පරිත්‍යාගශීලීන් පිළිබඳව වාර්තාවක් පවත්වාගෙන යෑම

IV. අ. භාරය සඳහා නියෝජ්‍ය සභාපතිවරයෙක් , නියෝජ්‍ය ලේකම්වරයෙක් සහ භාන්ඩාගාරික වරයෙක් විය යුත්තේය.

ආ. ප්‍රධාන නිලයක පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක එකී පුරප්පාඩුව ඉනික්න්බිතිව පැවත්වෙන කැබිනට් මණ්ඩලය විසින් තොරා පත් කරගන්නා තෙක් එකී ධූරයේ වගකීම් ආවරණය කිරීම නියොජ්‍ය සභාපති, ලේකම් සහ භාන්ඩාගාරිකගේ වගකීම වන්නෙය.

ඇ. නියෝජ්‍ය තනතුරු සඳහා භාරයේ සාමාජිකයන් චන්ද බලය හිමි සාමාජිකයකු තොරා ගැනිම භාර මණ්ඩලයේ යෝජනා සම්මතයෙන් විය යුත්තේය.

V. අ. සභාපතිවයා හැර භාරයේ ප්‍රධාන නිළධාරින් තෝරා ගැනීම කැබිනට් මණ්ඩලය විසින් කල යුතු අතර සහ පුරපාඩු පිරවීම භාරකාර මණ්ඩලයේ නිර්දේශය මත කැබිනට් මණ්ඩලය මගින් කල යුත්තේය.

ආ. ඕනෑම නිලයක් මියයාම, සභාපති හෝ ලේකම් වෙත ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත ඉල්ලා අස්වීම, භාරයේ රැස්වීම් සඳහා අඛණ්ඩව වාර තුනකට වඩා සහාභාගි නොවීම, භාරයේ කටයුතු සඳහා සක්‍රියව දායකවීමට නොහැකිවීම ,ශාරීරික හෝ මානසික දුබලතාව මත සිය වගකීම් ඉටු කිරීමට නොහැකි බව හෝ සිංහ සේවය ගෞරවයට හානිවන ආකාරයේ හැසිරීමක් මත භාරකාර මණ්ඩලයේ නිර්දේශය මත කැබිනට් මණ්ඩලයේ බහුතර යෝජනාවකින් ඉවත් කල හැක්කේය.

VI. අ. භාරයේ සෑම නිළධාරියකුම භාර මණ්ඩලයේ පොදු විධානය අනුව සිය වගකීම් හා කර්ත්ව්‍යයන් ඉටුකල යුත්තේය.

ආ. සිය වගකීම් හා යුතුකම් ඉටුකිරීම සම්බන්ධයෙන් සෑම නිළධාරියකුම පුද්ගලිකව සහ පොදුවේ භාර මණ්ඩලයට, කැබිනට් මණ්ඩලයට සහ දිස්ත්‍රික්කයට වගකීමටත් උත්තර දීමටත් බැඳී සිටින්නේය.

## 12. කළමණාකරණ මණ්ඩලය

1. භාර මණ්ඩලයේ යෝජනා සම්මතයකින් භාරය සතු දේපල පරිපාලනය සහ සේවා සැපයීම සඳහා කළමණාකරණ මණ්ඩලයක් පත් කල හැක්කේය.
2. එම කළමණාකරණ මණ්ඩලය සඳහා නිළධාරින් පත් කිරීම, ඉවත් කිරීම , විනය පාලනය, වගකීම්, බලතල, කයීන් සහ ආනුශාංගික කරුණු සම්බන්ධයෙන් රීති සකස් කිරීමේ බලය භාර මණ්ඩලය සතු වන්නේය.

## 13. මූල්‍ය කටයුතු

1. භාරයේ මූල්‍ය වර්ෂය සෑම වර්ෂයකම ජූලි මස 01 වන දා සිට එළඹෙන වර්ෂයේ ජූනි මස 30 වන දා විය යුතුය.
2. අ. කැබිනට් මණ්ඩලයේ අනුමැතියකින් වැඩි දුර කාලයක් ලබා ගතහොඉත් මිස,මූල්‍ය වර්ෂය අවසාන වීමෙන් මසක කාලයක් ඉකුත් වීමට පෙර භාරයේ ගිණුම් වාර්තා දිස්ත්‍රික් මූල්‍ය කමිටුවේ නිර්දේශ සහිතව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කල යුතුය. කෙසේ වුවද වැඩි දුර කාලයක් සඳහා වන



Scanned with CamScanner

කැබිනට් අනුමැතිය දෙවන කැබිනට් මණ්ඩලය පැවැත්වෙන දිනය නොඉක්මවිය යුතුය.

ආ.කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව මූල්‍ය වාර්තා දිස්ත්‍රික්කයේ විගණන කටයුතු සඳහා අනුමැතිය ලැබූ විගණන ආයතනයට යොමු කල යුතුය.

ඇ. විගණනය කරන ලද මූල්‍ය වාර්තාව කැබිනට් අනුමැතිය ලැබීමෙන් අනතුරුව දිස්ත්‍රික් සම්මේලනයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතුය.

3. අ. භාණ්ඩාගාරිකවරයා විසින් භාර මණ්ඩලයට ත්‍රෛයිමාසික වාර්තාවක් ඉදිරිපත් කල යුත්තේය.

ආ.භාණ්ඩාගාරික වරයා විසින් දිස්ත්‍රික් මූල්‍ය කමිටුවේ නිර්දේශය මත අර්ධ වාර්ෂික මූල්‍ය වාර්තාවක් බහු මණ්ඩලය විසින් අනුමත කල ආකෘතියට සාරානුකූලව කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුත්තේය.

4. භාරය වෙනුවෙන් චෙක්පත් ද ඇතුලුව සියලුම මූල්‍ය ලේඛණ භාණ්ඩාගාරිකවරයාගේ අනිවාර්‍ය අත්සන සහ සභාපති හෝ ලේකම්ගේ අත්සන යටතේ විය යුතුය.

5. භාර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන බැංකුවක භාරය සඳහා අවශ්‍ය වන බැංකු ගිණුම් ආරම්භ කර පවත්වාගෙන යා හැක්කේය.

## 14. භාර ව්‍යවස්ථාව සංශෝධනය

I. භාර ව්‍යවස්ථාව සම්බන්ධයෙන් වන සංශෝධන යෝජනාවක් භාර මණ්ඩලයේ ඕනෑම සාමාජිකයකු විසින් භාර මණ්ඩලයේ ලේකම්වරයා වෙත යොමු කල හැක්කේය.

II. එකී සංශෝධන යෝජනාව මගින් භාර ව්‍යවස්ථාව සංශෝධනය වන්නේ කෙසේද යන්න පැහැදිලිව දැක්වෙන කෙටුම්පතක ස්වරූපයෙන් ලේකම්වරයා වෙත ඉදිරිපත් විය යුතු අතර ඒ සඳහා විශේෂ රැස්වීමක් අවශ්‍ය වන්නේද යන්න ද එම ඉල්ලීම සඳහා ඇතුලත් විය යුතුය.

III. එවනි කෙටුම්පතක් සලකා බැලීම සඳහා විශේෂ රැස්වීමක් කැඳවිය යුත්තේ යැයි භාරයේ සභාපතිවරයා සහ සිංහාධිපතිවරයා එකඟවන්නේ නම් මිස, එවැනි යෝජනාවක් එම යෝජනාව ඉදිරිපත් කිරීමෙන් දින 15 ක් ඉක්මවීමෙන් ඉනික්බිතිව පැවැත්වෙන භාර මණ්ඩලයේ රැස්වීමට ඉදිරිපත් කිරීම ලේකම්වරයාගේ වගකීම් වන්නේය.

IV. එම කෙටුම්පත විශේෂ රැස්වීමක් සඳහා යොමු කරන්නේ නම් දින 7 ක ද නොවේසේ නම් දින 10 කට පූර්වයෙන් සියලුම සාමාජිකයන්ට දැන ගැනීමට සැලැස්වීම භාරයේ ලේකම්වරයාගෙ වගකීම වන්නේය.

V. භාර මණ්ඩලය විසින් එකී යෝජනාව සලකා බැලීමෙන් අනතුරුව , අවශ්‍ය සංශෝධන සහිතව භාරයේ නොපැමිණි සාමාජිකයන් ද ඇතුලුව 2/3 ක අනුමැතියෙන් සංශෝධනය විය යුතු අතර එකී සංශෝධන මුල් ව්‍යවස්ථාවට අමුණා සභාපති සහ ලේකම් විසින් මෙම ප්‍රතිපාදන අනුව නිසි ලෙස සම්මත වූ බවට ස්වකීය අත්සන් යෙදිය යුතුය.

VI. එසේ අත්සන් තැබූ සංශෝධන ලේකම්වරයා විසින් දිස්ත්‍රික් කැබිනට් ලේකම්වරයා මගින් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර කැබිනට් අනුමැතිය ලැබීමෙන් පසුව බලාත්මක වන්නේය.

VII. .කෙසේ වුවද දිස්ත්‍රික්කයට අනුබද්ධ ආයතනයක ව්‍යවස්ථාවක් සංශෝධනය කිරීම සඳහා දිස්ත්‍රික් සාමාජිකයකුට ඇති අයිතිය මෙයින් අවහිර නොවන බව සැලකිය යුතුය.

## 15. මතභේද නිරාකරණය කිරීම

I. භාර මණ්ඩල සාමාජිකයකු හෝ සාමාජිකයන් සම්බන්ධයෙන් භාර මණ්ඩලය තුල පැන නගින කරුණක් සම්බන්ධයෙන් දිස්ත්‍රික්කය විසින් සිංහ සමාජ සඳහා හඳුන්වාදී ඇති ගැටුම් නිරාකරණ කාර්‍යපටිපාටිය අවශ්‍ය වෙනස් කම් සහිතව අදාල විය යුතුය.



Scanned with CamScanner

II. භාරය සම්බන්ධයෙන් හෝ භාර මණ්ඩල සාමාජිකයකු සම්බන්ධයෙන් පැන නගින කරුණක් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ව්‍යවස්ථාව තුල ගැටුම් නිරාකරණය සඳහා අදාල වන ප්‍රතිපාදන අවශ්‍ය වෙනස්කම් සහිතව අදාල විය යුතුය.

**16. අඛණ්ඩ පැවත්ම සහ නෛතික පුද්ගලභාවය**

I. භාරය සඳහා අඛණ්ඩ පැවත්මක් ඇති අතර දිස්ත්‍රික්කය ඒකාබද්ධ කිරීමකදී හෝ නැවත බෙදීමකදී දිස්ත්‍රික්කය නියෝජනය කරන සිංහ සමාජ අයත්වන දිස්ත්‍රික්ක වෙත භාර දේපල සහ භාර මණ්ඩලයේ නියෝජනය සමානව හිමි විය යුතුය.

II. භාරයට නිශ්චල දේපල දැරීමටත් පැවරීමටත් භාරයේ නමින් නඩු පැවරීමටත් භාරයට එරෙහිව නඩු පැවරීමටත් හැකියාව ඇත්තේය.

**17. භාරය විසුරුවා හැරීම**

I. භාරය තව දුරටත් පවත්වාගෙන යෑමට නොහැකි තත්වයක් ඇතිබවට නොපැමිණි සාමාජිකයන් ද ඇතුලුව 2/3 ක සම්මතයකින් භාර මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ විට ලේකම්වරයා විසින් එම යෝජනාව "භාරය විසුරුවා හැරීම සඳහා කරනු ලබන යෝජනාව" ලෙස කැබිනට් ලේකම් මගින් කැබිනට් මණ්ඩලයට දැනුම්දිය යුත්තෙය.
එවැනි යෝජනාවක් සම්මත කිරීමේදී භාර මණ්ඩලය විසින් ව්‍යවස්ථාව සංශෝධනය සම්බන්ධයෙන් වන කාර්‍ය පටිපාටික ප්‍රතිපාදන අවශ්‍ය වෙනස් කම් සහිතව අදාල කර ගත යුත්තේය.

II. කැබිනට් මණ්ඩලයට එවැනි යෝජනාවක් ඉදිරිපත් වූ විට භාරය එසේ අවසන් කිරීම හෝ සංශෝධන සහිතව භාරය පවත්වා ගෙන යා යුතුදැයි නිර්දේශ කිරීම සඳහා සිංහාධිපතිවරයා විසින් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතුව භාර සාමාජිකයන් නොවන පස්දෙනකුට නොවැඩි අනු කමිටුවක් පත් කල යුත්තේය.

III. . එම අනුකමිටුව විසින් අදාල පුද්ගලයන් විමසීමෙන් සහ අවශ්‍යයැයි හැඟෙන වෙනත් කරුණු සලකා බැලීමෙන් අනතුරුව සිය නිර්දේශය මාස 06 ක් ඉනික්බිතිව පැවත්වෙන කැබිනට් මණ්ඩලයට වාර්තා කල යුතුය.

IV. එම වාර්තාවේ නිර්දේශය අනුව භාරය විසුරුවා හැරීමට නිර්දේශ කරන්නේ නම් එම යෝජනාව කැබිනට් මණ්ඩලයේ අනුමැතියට යටත්ව අනුමැතිය සඳහා දිස්ත්‍රික් සම්මේලනයට යොමු කිරීම සිංහාධිපතිවරයාගේ වගකීම වන්නේය.

V. එවැනි යොමු කිරීමකදී භාරය ඇවර කිරීම සඳහා වත්කම් සහ වගකීම් වාර්තාවක් සහ අනෙකුත් නීතිමය අවශ්‍යතා සඳහා අනුකමිටුවක් ද සිංහාධිපතිවරයා විසින් සම්මේලනයට යොමු කල යුත්තේය.

VI. භාරය විසුරුවා හැරීමකදී භාරයට අයත් නිශ්චල සහ චංචල දේපල එම දේපල පරිත්‍යාග කල පුද්ගලයන්ට හිමි විය යුතු අතර එසේ පරිත්‍යාගකරුවකු හඳුනාගත නොහැකි අවස්ථාවක එකී දේපල සහ භාරය සතු මූල්‍ය වත්කම් කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් පුණ්‍ය භාරයකට යොමු කල යුත්තේය.

**18. අදාල වන නීතිය**

I. භාරය සම්බන්ධයෙන් හෝ එයින් පැන නගින කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බලාත්මක වන නීතිය අදාල වන්නේය.

II. මෙම භාරයට සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව සම්මත කරනු ලබන යම් නීතියක් වේ නම් මෙම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන එම නීතිය හා අනුකූල නොවන තාක් දුරට බලාත්මක වන්නේය.



Scanned with CamScanner

III. මෙම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන සිංහ දිස්ත්‍රික්කයේ ව්‍යවස්ථාවට සහ ජාත්‍යන්තර අධ්‍යක්ෂක මණ්ඩලයේ රීතිවලට අනනුකූලව ක්‍රියාත්මක වන්නේය.

**19. අර්ථ නිරූපණය**

I. දිස්ත්‍රික්කය- 306ඒ2 සිංහ දිස්ත්‍රික්කය
II. කැබිනට් මණ්ඩලය- 306ඒ 2 සිංහ දිස්ත්‍රික්කයේ කැබිනට් මණ්ඩලය
III. බහු මණ්ඩලය- 306 සිංහ දිස්ත්‍රික් බහු මණ්ඩලය

මෙයට සාක්ෂ්‍ය පිණිස ඉහත නම් සඳහන් ප්‍රදායක වන හැන්නදිගේ කුමුදු තුෂාර පීරිස් සහ මෙම භාරයේ යාවජීව සාමාජිකයකු වන මලිගස්පේ කෝරාලගේ අනිල් අර්වින් නානායක්කාර අප මෙයටත් මේ දාතමින් යුතු මේ හා සමාන තවත් ලේඛණ තුනකටත් වර්ෂ 2022 සැප්තැම්බර් මස 26 වන දින පොල්ගස් ඕවිටදී අත්සන් තැබීමු.

සාක්ෂි

මෙහි සාක්ෂිකරුවන් වන අප මෙහි අත්සන් කළ අය හොඳින් දන්නා බවත් ඔවුන්ගේ නියම නම්, පදිංචි ස්ථාන සහ රැකී රක්ෂාවන් දන්නා බවත් ප්‍රකාශ කරමු.

ප්‍රදායක

යාවජීව භාරකරු

1.

2.

නුවන් බැල්ලන්තුඩාව
මහජන නොතාරිස්

කොළඹ දිස්ත්‍රික්කයේ පදිංචි බැල්ලන්තුඩාව අච්චිගේ නුවන් චාමර ඉදුනිල් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රාන්තවාදි ජනරජයේ මහජන නොතාරිස් වන මා විසින් හඳුනන දෙදෙනාම ඉංග්‍රිසියෙන් ඇපහැදිලි ලෙස අත්සන් කල බොරලැස්ගමුව, කටුවාවල, බන්ඩාරවත්ත 43/බී හි පදිංචි උඩුමලගල කනත්ත ගමගේ ප්‍රසාද් සුසන්ත පුෂ්පකුමාර (ජා.හැ අංක 197115701655වී) සහ පානදූර, අළුබෝමුල්ල, මහබෙල්ලන, තොටුපල පාර ,අංක 28බී හි පදිංචි බලගේ සරත් ප්‍රේමසිරි පෙරේරා (ජා.හැ අංක 711592113වී) යන සාක්ෂිකරුවන් ඉදිරියේදි එකී සාක්ෂිකරුවන් විසින් සහ මා විසින් ද හඳුනන එහි නම් සඳහන් මෙම භාරයේ ප්‍රදායක වන හැන්නදිගේ කුමුදු තුෂාර පීරිස් සහ එහි මලිගස්පේ කෝරාලගේ අනිල් අර්වින් නානායක්කාර යන යන අයවලුන්ට මා විසින් කියවා තේරුම්කර දීමෙන් අනතුරුව ඔවුන් විසින් ද ඉහත කී සාක්ෂිකරුවන් විසින් ද එකී නොතාරිස් තැන වන මා විසින් ද යන සියලු දෙනා එක්ව සිටියදි, මා ඉදිරිපිටදි සහ ඔවුන් එකිනෙකා ඉදිරිපිටදි වර්ෂ 2022 සැප්තැම්බර් මස 26 වන දි පොල්ගස්ඕවිටදි අත්සන් කල බව මෙයින් සැබෑ කොට සහතික කරමි.

තවද මෙම ගණුදෙනුවට අදාල ප්‍රතිෂ්ඨාව මා ඉදිරියේදි ගනුදෙනු වු බවද මෙහි මුල් පිටපතට රුපියල් 20/- මුද්දර ඇලවු බවත් එකී මුද්දර මා විසින් සපයා ගත් බවත් සහතික කරමි.

සහතික කලේ වර්ෂ 2022 සැප්තැම්බර් මස 26 වන දීය.

නුවන් ඉදුනිල් බැල්ලන්තුඩාව

මහජන නොතාරිස් සහ නිතීඥ



Scanned with CamScanner